මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) අදියර II හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2008 ජූලි 29 දින හා 2011 මාර්තු 22 දිනයන් හිදී එළඹි අංක එස්එල් - පී 91 සහ අංක එස්එල් - පී 10 දරන ණය ගිවිසුමේ ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ අදියර II හි ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ නාගරික ප්‍රදේශයේ වාහන තදබදය අවම කිරීමට හැකි වන පරිදි දක්ෂිණ අධිවේගය හා කොළඹ නගරයේ සිට විහිදෙන අනෙකුත් ජාතික මාර්ග සමග සම්බන්ධ වන කොළඹට මායිම්ව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම හා එමගින් රටේ අනෙකුත් ප්‍රදේශ සමග සම්බන්ධතාවය පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.ණය ගිවිසුම අනුව, අදියර II ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 55,482 කට සමාන ජපාන යෙන් මිලියන 44,097 ක් වූ අතර ඉන් රු.මිලියන 46,759 කට සමාන ජපාන යෙන් මිලියන 37,406 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූලනාය කිරීමට එකග වී තිබුණි. අදියර II යටතේ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු 2015 ජූලි 18 දින නිම කර තිබුණි.කෙසේ වෙතත් 2018 දෙසැම්බර් 31 අවසන් වර්ෂය දක්වා ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන ආ අතර මූල්‍ය ප්‍රකාශනද විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මතය

------

මාගේ මතය,ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශණයන් තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 මතය සඳහා පදනම

--------------------

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනයට සම්බන්ධ අය සතුවේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 භෞතික කාර්ය සාධනය

---

### 2.1 ව්‍යාපෘති කාර්යයන්ගේ භෞතික වර්ධනය

---

2012 ජනවාරි 09 දින ආරම්භ කර තිබුණු කඩුවෙල සිට කඩවත දක්වා කිලෝමීටර් 8.9 ක දිගකින් රු: බිලියන 44.88 ක වටිනාකමකින් යුතු පිටතවටරවුම් මහාමාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2015 ජනවාරි 08 දින අවසන් කිරිමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත් මහාමාර්ගයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ දින 190 ක ප්‍රමාදයක් සහිතව 2015 ජූලි 18 දින නිමකර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි.

## 2.2 ව්‍යාපෘති අරමුණුවලින් පරිබාහිරව මුදල් ගෙවීම

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ගෙවීම් සිදුනොකරන ලද වටිනාකම් මත ණය දෙන ආයතනය විසින් රු.මිලියන 311.6 ක බැඳීම් ගාස්තු 2018 දෙසැම්බර් 31 වන විට අයකරගෙන තිබුණි. | අතිරේක වියදමක් දැරීමට සිදුවිය . | ප්‍රතිචාර නොදැක්විය | ප්‍රතිපාදනයන් උපයෝජණය ප්‍රමාද වීමට හේතු වූ කරුණු විමර්ෂණය කිරීම අවශ්‍ය වේ |

## 2.3 විවිධාත්මක ස්වරූපයේ කරුණු

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම නිසා සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ 53.1 වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද රු.බිලියන 4.37ක කාලය දීර්ඝ කිරීමේ වන්දි හිමිකම් පෑමක් ව්‍යාපෘතිය විසින් ප්‍රතික්ෂේපකර තිබුණු අතර එය කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය වෙත යොමුකර ඇත. කෙසේවෙතත් 2019 ජුලි 31 වන විටත් අදාල ආරවුල විසඳී නොතිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය ඉක්මවා යා හැකිය. | කොන්ත්‍රාත්කරු 2019 අගෝස්තු මාසයේදී කාලය දීර්ඝ කිරීම නිසා පිරිවැයකට හිමිකම්පෑම ආරවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය වෙත යොමුකර තිබුණා. කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව, ආරවුල් විනිශ්චය මණ්ඩලයට හිමිකම්පෑම සඳහා කාල සීමාවක් නොමැත. | අඩුම පාඩුවක් සහිතව තත්ත්වය සමනයකර ගැනීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ |

2.4 **ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු**

-------------------------------------

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| කඩුවෙල සිට කඩවත දක්වා මහා මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා අත්පත් කිරීමට සැලසුම් කරන ලද රජයට අයිත් ඉඩම් කැබිලි 185ක් ද ඇතුළුව ඉඩම් කැබලි 1442 න් ඉඩම් කැබලි 1141ක් අත්පත්කර ගෙන තිබුණු අතර, ඒ සඳහා වන්දි වශයෙන් රුපියල් මිලියන 1458 ක් 2018 දෙසැම්බර් 31 වන විට ගෙවා තිබුණි. කෙසේවෙතත් එම දිනයවන විට ඉඩම් කැබලි 667ක් පමණක් ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචිකර තිබුණි. එයට අමතරව වන්දි මුදල් ගෙවීම ප්‍රමාදවීම නිසා ප්‍රවර්ථන වර්ෂය අවසන්වන විට රු.මිලියන 299.51ක මුදලක් පොලිය ලෙස වියදම්කර තිබුණි. | වන්දි ගෙවීම සඳහා අමතර පොලී වියදම් දැරීමට සිදුවිය හැකිය. | ප්‍රතිචාර නොදක්වන ලදී. | ඉඩම් අත්පත්කර ගැනීමේ ඉතිරි වැඩ ඉක්මන් කිරීමට අවශ්‍ය කටයුතු ව්‍යාපෘතිය විසින් ගැනීම අවශ්‍ය වේ. |